


# ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය පිළිබඳ විශ්වාසනීයත්ව දර්ශකය

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
සෝෂල් ඉන්ඩිකේටර්

අගෝස්තු 2022

# හැඳින්වීම

නිදහසින් පසු ශ්‍රී ලංකා ඉතිහාසයේ දරුණුතම ආර්ථික අර්බුදයකට වර්තමානයේ රට මුහුණ දී සිටී. එසේම අප්‍රේල් මාසයේදී ශ්‍රී ලංකාව පළමුවරට සිය ණය ගෙවීම පැහැර හැර ඇත. එතැන් සිට උද්ධමනය වැඩිවීමට අමතරව ඉන්ධන, ආහාර, ඖෂධ හිඟය වැනි ගැටලුවලට ජනතාව මුහුණදෙමින් සිටියි. එයට ප්‍රතිචාර වශයෙන්, දිවයින පුරා සිටින ලක්ෂ සංඛ්‍යාත ශ්‍රී ලාංකිකයෝ ගෝඨාභය රාජපක්ෂ සහ රාජපක්ෂ පවුල් පාලනයේ, දුර්වල ආර්ථික කළමනාකරණය රට පෙර නොවූ විරූ ආර්ථික අර්බුදයකට ගෙනයාම සම්බන්ධයෙන් විරෝධය පළ කළහ. ඒ අනුව තරුණ තරුණියන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී සහ අවිහිංසාවාදී සක්‍රිය පුරවැසි ක්‍රියාකාරකම්හි ප්‍රතිඵලයක් ලෙස ගෝඨාභය රාජපක්ෂ දිවයිනෙන් පැන ගොස් සිය ඉල්ලා අස්වීම භාර දෙන ලදී. මෙසේ ජනාධිපති ධූරයේ හිස්වීමත් සමඟ අටවැනි විධායක ජනාධිපතිවරයා ලෙස රනිල් වික්‍රමසිංහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ඡන්දයෙන් තේරී පත් විය. මෙම පසුබිම යටතේ අරගලයේ මහජන අත්දැකීම් සහ මහජන මතය මෙන්ම වර්තමාන ආර්ථික හා දේශපාලන අර්බුදයේ විවිධ පැතිකඩයන් ග්‍රහණය කර ගැනීමේ අරමුණින් දීප ව්‍යාප්ත ජනමත විමසුමක් සැලසුම් කරන ලදි.

මෙම පර්යේෂණ අධ්‍යයනය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණ පර්යේෂණ අංශය වන සෝෂල් ඉන්ඩිකේටර් (SI) විසින් 2022 අගෝස්තු 1 සිට 5 දක්වා කාලය තුළ සිදු කරන ලදී. මෙම සමීක්ෂණය දිවයින පුරා විවිධ ප්‍රදේශවලට අයත් සිංහල, දෙමළ, උඩරට දෙමළ සහ මුස්ලිම් ප්‍රජාව සහ විවිධ වයස්, විවිධ ආර්ථික කණ්ඩායම්න්ට අයත් ස්ත්‍රීන් පුරුෂයන් 1100 දෙනෙකු සමඟ මුහුණට මුහුණලා කරනු ලබන සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතා කරමින් පවත්වන ලදී. සමීක්ෂණ පර්යේෂණ කණ්ඩායමෙහි ආචාර්ය ප්‍රදීප් පීරිස්, එම්. ක්‍රිෂ්ණමූර්ති, මුදිතා පතිරණ, ඉෂාරා ජයරත්න සහ අස්රා ෆායිස් යන අයගෙන් සමන්විත විය. මෙම අධ්‍යයනය සාර්ථක කර ගැනීම සඳහා සහයෝගය ලබා දුන් ආචාර්ය පාක්‍යසෝති සරවණමුත්තු මහතාට ස්තුතිවන්ත වන අතර මෙහි කවරයේ ඡායාරූපය මාත්‍රම්හි (https://maatram.org) කතෘ සෙල්වරාජා රාජසේගර් විසින් ඡායාරූපගත කරන ලද්දකි.

# ක්‍රමවේදය

ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය පිළිබඳ විශ්වාසනීයත්ව දර්ශකයෙහි තුන්වන අදියර සඳහා ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් හතර නියෝජනය වන පරිදි (සිංහල, දෙමළ, උඩරට දෙමළ සහ මුස්ලිම්) 1100ක පිරිසකින් යුතු නියැදියක්  සඳහා අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිතා කරන ලදී. තවද, මෙම නියැදිය දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල පුරුෂයන් සහ ස්ත්‍රීන්ගෙන් සමන්විත වේ. මෙහිදී ප්‍රතිචාර දැක්වූවන් 1100 දෙනා අහඹු නියැදි තාක්ෂණය භාවිතයෙන් තෝරා ගන්නා ලද අතර නියැදි ස්ථාන තෝරා ගැනීම සඳහා බහු අදියර අහඹු ස්ථර නියැදි ක්‍රමයක් භාවිතා කරන ලදී. මෙම ජාතික මත විමසීම සඳහා ක්ෂේත්‍ර කටයුතු 2022 අගෝස්තු මස පළමුවැනිදා සිට පස්වැනිදා දක්වා පවත්වන ලදී. මෙම අධ්‍යයනයට ප්‍රධාන වාර්ගික ප්‍රජාවන් හතරෙහි ස්ත්‍රීන් සහ පුරුෂයන් 82 ක්ෂේත්‍ර සමීක්ෂකයන් ලෙස සහභාගී විය. මෙම සමීක්ෂණයේ එකතු කරන ලද දත්තවල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා සම්පූර්ණ නියැදියෙන් 10% කට වඩා වැඩි ප්‍රමාණයක් තත්ත්ව පරීක්ෂාවට ලක් කරන ලදී.එහිදී දත්ත කට්ටලය, ජනගහනයේ සැබෑ දිස්ත්‍රික්කය සහ ජනවාර්ගික අනුපාතය පිළිඹිබු කීරීම සදහා බර තබා ඇත. මෙහි දත්ත සමාජ විද්‍යාවන් සඳහා භාවිතා වන සංඛ්‍යාන පැකේජය (SPSS) භාවිතා කරමින් විශ්ලේෂණය කර ඇත.

# විධායක සාරාංශය

## ආදායම් සහ වියදම්

- ශ්‍රී ලාංකිකයන්ගෙන් සැලකිය යුතු බහුතරයක් (80%) ප්‍රකාශ කරන්නේ ඔවුන්ගේ ආදායම ඔවුන්ගේ අවශ්‍යතා සපුරාගැනීමට ප්‍රමාණවත් නොවන බවයි.
- අනෙකුත් ප්‍රදේශ හා සසඳන විට, වැඩි වශයෙන් ප්‍රාදේශීය සභාවලට අයත් ප්‍රදේශවල ජනතාව ඔවුන්ගේ අවශ්‍යතා සපුරාගැනීමේ දී දුෂ්කරතාවන්ට මුහුණ දී සිටියි.

## අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් ඇති වන දුෂ්කරතා

- අති බහුතරයක් (83%) ඔවුන් මිලදී ගැනීමට පුරුදු වී සිටි ආහාර ද්‍රව්‍ය හෝ ආහාරවල ගුණාත්මකභාවයහි කැපකිරීම් කර ඇති බව ප්‍රකාශ කරයි.
- 42% ක් පමණ ප්‍රකාශ කරන්නේ ඔවුන් තම ආහාර වේලෙහි කොටස/ප්‍රමාණය හෝ දිනකට අනුභව කරන ආහාර ප්‍රමාණය අඩු කර ඇති බවයි.
- ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයකට (66%) ඖෂධ සහ වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීමේ දුෂ්කරතා පවතී.
- සැලකිය යුතු ප්‍රතිශතයක් (87%) ප්‍රකාශ කරන්නේ ගෘහස්ථ වියදම් වැඩි වීමේ දුෂ්කරතා දරාගැනීමට අපහසු බවයි.
- ශ්‍රී ලාංකිකයන්ගෙන් තුනෙන් එකකට වඩා වැඩි ප්‍රමාණයක් ප්‍රකාශ කරන්නේ ඔවුන් හෝ ඔවුන්ගේ පවුල්වල කිසියම් අයෙකුට රැකියාව අහිමි වී ඇති බවයි.

## නායකයින් කෙරෙහි විශ්වාසය

- අනුර කුමාර දිසානායක (48.5%) වර්තමාන ආර්ථික අර්බුදය විසඳීම සඳහා නිවැරදි තීන්දු තීරණ ගනීවී යැයි ඉහළ ප්‍රතිශතයක් විශ්වාසයක් තබයි.
- රනිල් වික්‍රමසිංහ නිවැරදි තීන්දු තීරණ ගනු ඇතැයි 36.6% ක් විශ්වාස කරන අතර 29.1% ක් සජිත් ප්‍රේමදාස කෙරෙහි විශ්වාසය පළ කරයි.
- මහින්ද රාජපක්ෂ වත්මන් ආර්ථික අර්බුදය විසඳීම සඳහා නිවැරදි තීන්දු තීරණ ගනු ඇතැයි අවම විශ්වාසයක් ලබාගෙන ඇති නායකයා වේ (11.9%).
- සිංහල ප්‍රජාවට සාපේක්ෂව සජිත් ප්‍රේමදාස කෙරෙහි සුළුතර ප්‍රජාවන් වැඩි විශ්වාසයක් තබා ඇති බව පෙනේ.
- වැඩිහිටි ජනගහනයට සාපේක්ෂව තරුණ පිරිස අනුර කුමාර දිසානායක වැඩි වශයෙන් විශ්වාස කරයි.

## අරගලය මෙහෙයවූ තරුණ තරුණියන් පිළිබඳ මතය

- අරගලයට සම්බන්ධ වූ තරුණ තරුණියන් පිළිබඳ බහුතර ශ්‍රී ලාංකිකයෝ ධනාත්මක මතයක් පළ කරති.
- රට වඩා හොඳ ප්‍රජාතන්ත්‍රවාදයක් කරා ප්‍රතිසංස්කරණය කිරීමේ අරමුණින් අරගලය මෙහෙයවනු ලබන්නේ සක්‍රීය පුරවැසියන් ලෙස ක්‍රියා කරන තරුණ තරුණියන් විසින් බව ශ්‍රී ලාංකිකයන්ගෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් (84%) එකඟ වේ.
- අරගලය මෙහෙයවන්නේ දේශපාලන අවබෝධයක් නොමැති, මත්ද්‍රව්‍ය භාවිතා කරන පිරිසක් යන මතයට ශ්‍රී ලාංකිකයන් බොහෝ පිරිසක් (88%) එකඟ නොවේ. අරගලයට සම්බන්ධ තරුණ තරුණියන් ප්‍රචණ්ඩකාරී කණ්ඩායම්වලට සම්බන්ධ බවට ජනගහනයෙන් 82% ක් පමණ එකඟ නොවේ.

## අරගලයට නායකත්වය දුන් තරුණ තරුණියන් ජනාධිපති ලේකම් කාර්යාල පරිශ්‍රයෙන් ඉවත් කිරීම පිළිබඳ මතය

- අරගලයට නායකත්වය දුන් තරුණ තරුණියන් ජනාධිපති ලේකම් කාර්යාල පරිශ්‍රයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් මහජනතාවගෙන් තුනෙන් දෙකක් පමණ අනුමත නොකරයි. ජනවාර්ගික කණ්ඩායම් හතර අතර මෙන්ම නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශ සහ වයස් කාණ්ඩ අතර පවතින පොදු මතය ද මෙයයි.

## හදිසි නීතිය සම්මත කිරීම පිළිබඳ මතය

- 2022 ජූලි 27 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් හදිසි නීතිය දිවයිනේ බහුතරයක් (65%) අනුමත නොකරයි. වාර්ගික දෘෂ්ටිකෝණයකින් බැලීමේදී, සිංහල මෙන්ම දෙමළ ප්‍රජාවෙහි හතරෙන් එකක් මෙය අනුමත කරයි.

## වත්මන් රජය වෙත විරෝධතාකරුවන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා පිළිබඳ මතය

- සියලු දේශපාලනඥයන් විගණනයට ලක් කළ යුතු අතර ඔවුන්ගේ විගණනය කළ නොහැකි ධනය රජය විසින් රාජසන්තක කළ යුතු යැයි සියළු දෙනාම පාහේ විශ්වාස කරයි.
- සෑම ශ්‍රී ලාංකිකයන් දස දෙනෙකුගෙන් නව දෙනෙකුම සිතන්නේ මහ මැතිවරණය ඉක්මනින් පැවැත්විය යුතු බවයි.
- 20 වැනි ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කර 19 වැනි සංශෝධනයට සමාන සංශෝධනයක් ගෙන ආ යුතු බව අති බහුතරයකගේ (87%) අදහසයි.
- පාර්ලිමේන්තුවේ සියලුම පක්ෂවලින් සමන්විත අන්තර්වාර ආණ්ඩුවක් ස්ථාපිත කළ යුතු බවට වන යෝජනාවට 83%කට වඩා වැඩි ප්‍රමාණයක් එකඟ වේ.
- ශ්‍රී ලාංකිකයන් හතර දෙනෙකුගෙන් තිදෙනෙකුගේම අදහස විධායක ජනාධිපති ක්‍රමය සම්පූර්ණයෙන්ම අහෝසි කළ යුතු බවයි.

## ජාත්‍යන්තර ප්‍රජාවේ සහයෝගය පිළිබඳ මතය

- වර්තමාන ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම සඳහා ශ්‍රී ලංකාවට සහය වීමට බොහෝ දුරට ඉදිරිපත් විය හැකි රට ලෙස චීනය ශ්‍රී ලාංකිකයන්ගෙන් හතරෙන් එකක් ශ්‍රේණිගත කරයි.
- මෙම ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම සඳහා ශ්‍රී ලංකාවට සහාය වීමට ඉදිරිපත් වීමට බොහෝ දුරට ඉඩ ඇති රටවල් ලෙස ශ්‍රී ලාංකිකයන්ගෙන් පහෙන් එකක් ඇමරිකා එක්සත් ජනපදය සහ ඉන්දියාව යන රටවල් ශ්‍රේණිගත කරයි.
- ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ට වඩා වයස අවුරුදු 50ට වැඩි පිරිස, චීනය සහයෝගය ලබා දේ යැයි සිතයි.

## රට සාමාන්‍ය තත්ත්වයට පැමිණීම පිළිබඳ විශ්වාසය

- 60%කට ආසන්න පිරිසකගේ මතය වී ඇත්තේ රට සාමාන්‍ය තත්ත්වයට පත්වීමට බොහෝ කාලයක් ගතවන බවයි.
- රට සාමාන්‍ය තත්ත්වයට පැමිණීම පිළිබඳ සියලුම වාර්ගික, ප්‍රදේශ සහ සියලුම වයස් කාණ්ඩවල මෙම අවිශ්වාස දක්නට ලැබේ.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදිත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිට වනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවි දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.

ලිපිනයඃ නො. 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව.
දුරකථනඃ +94 11 2081384/+94 11 2081385/ +94 11 2081386
ෆැක්ස්ඃ +94 (11) 2081388
වෙබ්ඃ www.cpalanka.org
විද්‍යුත් තැපැල ඃ info@cpalanka.org

සෝෂල් ඉන්ඩිකේටර් යනු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි (CPA) සමීක්ෂණ පර්යේෂණ ඒකකය වන අතර එය වර්ෂ 1999 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කෙරුණි. එමගින් සමාජ හා දේශපාලන කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ස්ථිර, වෘත්තීය සහ ස්වාධීන සමීක්ෂණ මධ්‍යස්ථානයක් සඳහා දීර්ඝ කාලීනව පැවති රික්තයක් පුරවා ඇත. මත විමසීම් හරහා අදහස් ප්‍රකාශ කිරීම ප්‍රජාතන්ත්‍රවාදය සවිබල ගැන්වීමේ මෙවලමක්ය යන දැඩි විශ්වාසයෙන් යුක්තව සෝෂල් ඉන්ඩිකේටර් ආරම්භයේ සිටම සමාජ-ආර්ථික හා දේශපාලන ගැටළු රාශියක් පිළිබඳව මත විමසීම් පවත්වනු ලබයි.

ලිපිනයඃ 6/1බී 1/1 ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 05, ශ්‍රී ලංකාව.
දුරකථනඃ +94 11 2584050
වෙබ් ඃ www.cpalanka.org/survey-research/
විද්‍යුත් තැපැලඃ krishna@cpasocialindicator.org